**කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි සිව්වන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය 2021 / 2022**

# SLG 4187 - සෞන්දර්ය විද්‍යාවේ මූලධර්ම හා සාහිත්‍ය විචාර දර්ශනය

(පැ දෙකයි)

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නයක් බැගින් වත් තෝරා ගෙන ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

## I කොටස

01. ප්ලේටෝගේ දාර්ශනික පද්ධතිය කෙරෙන් ඔහුගේ කලා විචාර න්‍යාය ප්‍රභවය ලබන අයුරු පහදා දෙන්න.

02. "කාව්‍යශාස්ත්‍රයෙහි වටිනාකමට තුඩු දෙන ප්‍රමුඛ හේතුවක් නම් ග්‍රීක ට්‍රැජඩි නාටකය පිළිබඳව එයින් සම්පාදනය කෙරෙන සෞන්දර්යාත්මක ඥානයයි". මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. "කලාකරුවා නිර්මාණ කාර්යයට මෙහෙයවනුයේ වෛෂයික අවශ්‍යතාවයි". මාක්ස්වාදී කලා විචාර න්‍යාය ඇසුරින් විභාග කරන්න.

## II කොටස

04. කාව්‍යෝක්තියක අන්තර්ගත සුවිශේෂ ධර්මතා සම්බන්ධයෙන් අලංකාරවාදීන් විසින් ඉදිරිපත් කරනු ලබූ අදහස් පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

05. "විභාවානුභාව ව්‍යභිචාරී සංයෝගයෙන් රස නිෂ්පත්තිය සිද්ධ වේ". මේ කියමන පැහැදිලි කොට අභිනවගුප්ත ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් විමර්ශනය කරන්න.

06. "ධ්වනිතාර්ථ යනු වචන හා සම්බන්ධ වාච්‍යාර්ථ අබිබවමින් නැගෙන අර්ථ විශේෂයකි". ධ්වනිවාදය ප්‍රමාණ කොට මේ පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.